# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No – 517

ෆැක්ස් / தொலை நகல் / Fax – 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone – 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail – dir.media@police.lk


---

මගේ අංකය / எனது இல / My No – 1022 / 2022

ඔබේ අංකය / உமது இல / Your No –

දිනය / திகதி / Date – 2022.07.14 පැය 2030

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### 2022 ජූලි 13 වන දින කොල්ලුපිටිය අග්‍රාමාත්‍ය කාර්යාලය පිහිටි ප්‍රදේශයේදී සිදුකරන ලද මහජන විරෝධතාවලදී රෝගී තත්ත්වයට පත්වූ විරෝධතාකරුවෙකු මියයාම.

2022.07.13 වන දින අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය ආශ්‍රිත ප්‍රදේශයේ ඇතිවූ විරෝධතාවයන් අතරතුර එක් විරෝධතාකරුවෙකුට ඇතිවූ හදිසි අසනීප තත්ත්වයක් නිසා කොළඹ නාරාහේන්පිට ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික රෝහලකට ඇතුලත් කිරීමත් සමඟම මියගොස් සිටින බවට වාර්තා විය. මෙම මියගිය පුද්ගලයා වයස අවුරුදු 26 ක් වූ දළදාගම, මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

මේ සම්බන්ධයෙන් කොළඹ අළුත්කඩේ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් පසු 2022.07.14 වන අද දින මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ ජාතික රෝහලේදී සිදු කරන ලදී.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව මරණයට හේතුව ලෙස සඳහන් කර ඇත්තේ කිරීටක ධමනි වල රුධිර කැටි ගැසීමක් නිසා ඇතිවූ හෘදයාබාධයකින් මෙම මරණය සිදුවී ඇති බවයි. මෙම පුද්ගලයා විවිධ විෂ මත්ද්‍රව්‍ය (හෙරොයින්, අයිස් ) හා මත්පැන් භාවිතයට ඇබ්බැහි සිටි පුද්ගලයකු බවටද නිරීක්ෂණය වී ඇත. අද දින මියගිය පුද්ගලයාගේ මෘත දේහය ඥාතීන් වෙත භාරදීමට කටයුතු කරන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**